# ෆෙඩරල් විරෝධී සංධානයක්

ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා කැබිනට් හා කැබිනට් නොවන අමාත්‍ය මණ්ඩල සංශෝධනයක් කිරීමකට වඩා නව කැබිනට් මණ්ඩලයක් පත්කර ඇතැයි කිව හැකි ය. එ ජා පක්ෂයේ කොටසක් දැන් ආණ්ඩුවේ ය. තවත් කොටසක් විපක්ෂයේ ය. කෙහෙළිය රඹුක්වැල්ල මහතා ආණ්ඩුවට එක්වීමත් සමග එවැනි තත්වයක් ගැන කතාකළ හැකි වුවත් දැන් එය තවදුරටත් නොසළකා නොසිටිය හැකි පමණට වර්ධනය වී ඇත. එ ජා පක්ෂයේ මන්ත්‍රීවරුන් විසිඑක්දෙනකු පමණ දැනටමත් ආණ්ඩුවට එක්වී කිනම් හෝ ඇමති ධුර දැරීම මෙරට දේශපාලනයේ අළුත් පෙළගැසීමකි. අද ආණ්ඩුවේ නැත්තේ දෙමළ එක්සත් සංවිධානය හා ජ වි පෙරමුණ පමණකි. (ජාතික හෙළ උරුමය නොබෝ දිනකින් ආණ්ඩුවට එක්වීමට නියමිත ය. කෙසේ වෙතත් බොහෝ කරුණුවල දී දැනටත් ඒ පක්ෂයේ සහාය ආණ්ඩුවට ලැබෙයි.)

ආණ්ඩුවට එක් වී ඇති සියළු පක්ෂ මහින්ද චින්තන පිළිගෙන ඇතැයි කියැවෙයි.  මහින්ද චින්තන ලංකා සමසමාජ පක්ෂය හා කොමියුනිස්ට් පක්ෂය වීසින් ද පිළිගැනී ඇත. එහෙත් ඒ පක්ෂ සන්ධීය හෙවත් ෆෙඩරල් රාජ්‍යයක් ඇතිකිරීමට කැසකවන පක්ෂ දෙකකි. ඔවුහු ඒ බව වසාගැනීමට ෆෙඩරල් යන වචනය යොදාගැනීමකින් තොරව තමන්ට අවශ්‍ය පරිදි, එනම් ෆෙඩරල් ක්‍රමයකට අවශ්‍ය පරිදි, බලය බෙදීමට තැත්කරති. මේ පක්ෂ මහින්ද චින්තනවලට මුවා වී කොටි සංවිධානය සමග තවදුරටත් සාකච්ඡා පැවැත්විය යුතු යැයි කියයි. සර්ව පාක්ෂික කමිටුවට ඉදිරිපත්වන්නේ යැයි බලාපොරොත්තු තබාගෙන ඇති වාර්තාව කොටි සමග සාකච්ඡා ඇරඹීමට පදනම්කරගත යුතු යැයි ද ඔවුහු කියා සිටිති. ඊ. පී ඩී. පී සංවිධානය පවා එවැනි ඉල්ලීමක් ඉදිරිපත් නොකරයි. එහෙත් ලංකා කම්කරු කොංග්‍රසයට කොටි සමග සාකච්ඡා අවශ්‍ය ය.

ගාල්ලේ පසුගිය දා පැවති ආධාර සම්මේලනයේ දී බටහිර නියෝජිතයන් පුන පුනා කියා ඇති කරුණක් නම් ආණ්ඩුව කොටි සමග වහාම සාකච්ඡා ඇරඹිය යුතු බව ය. ඒ සඳහා ආණ්ඩුව ඉදිරිපත්කරන ලියැවිල්ල (වාර්තාව) කුමක් වේ දැයි දැනගැනීමට ඒ රටවල් කැමැත්තෙන් පසුවන්නේ යැයි කියැවෙයි. ආණ්ඩුවට අද ප්‍රධාන ප්‍රශ්නය වී ඇත්තේ අප කලක සිට කියන ආකාරයට ම, විදේශීය බලපෑම් ය. විදේශීය බලපෑම් නොවන්නට ආණ්ඩුවට මේ වන විට නැගෙනහිර පළාතෙන් පමණක් නොව උතුර පළාතන් ද කොටි පරාජයකිරීමේ හැකියාව තිබුණි. එහෙත් එක් කරුණක් මේ වන විට පැහැදිලි විය යුතු ය. අද ඇමරිකාවට හා බ්‍රිතානියට කොටි නායකත්වය ප්‍රතික්ෂෙපකිරීමට අවශ්‍ය වී ඇත. ඔවුන්ට ප්‍රභාකරන් දැන් උරවක්‍ර මාලයකි. ඔවුන් අද කල්පනාකරමිණ් සිටින්නේ ප්‍රභාකරන් පරාජයකිරීම ඊනියා ප්‍රජාතන්ත්‍රවාදී ආකාරයකට කරන්නේ කෙසේ ද යන්න ය. ප්‍රභාකරන් පරාජයකිරීමෙන් පසුව ඉදිරියට ගන්නේ කවුරුන් ද යන ප්‍රශ්නය ඇත. බටහිරයන්ට ප්‍රභාකරන් අවශ්‍ය නැති වුව ද දැනට කොටි  අවශ්‍ය වෙයි. ඔවුන් සිතන ආකාරයට කොටි සංවිධානය මුළුමනින් ම පරාජය වුවහොත් ඊනියා දෙමළ අභිලාශ ඉටුකරගැනීමට නොහැකි වනු ඇත.

ආණ්ඩුවට අළුතෙන් එක් වූ මන්ත්‍රීවරු මෙහි දී කෙසේ ක්‍රියාකරනු ඇත්දැයි යන්න අද සාකච්ඡාවට භාජනය වෙමින් පවතියි. ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය හැමදාමත් කෙළේ අනුන්ගේ පහනින් එළිය බැලීමකි. එහි නායකයෝ දෙමළ ජාතිවාදයේ ආධාරයෙන් මුස්ලිම් ප්‍රාන්ත වෙන්කරගැනීමට උත්සාහ දරති. එකට යා වූ මුස්කිම් ප්‍රදේශ ඉතා කුඩා නිසා ඔවුන් උත්සාහගන්නේ එසේ යා නොවූ ප්‍රදේශ එකතුකර මුස්ලිම් ප්‍රාන්ත ලබාගැනීමට ය. ඔවුන් ආණ්ඩුවට එකතු වී ඒ සඳහා තවත් බලකරනු ඇත. ජාතික හෙළ උරුමය උතුරු හා නැගෙනහිර පළාත් වෙන්ව තබාගෙන පළාත්සභා ක්‍රමය පවත්වාගෙනයෑමට කටයුතුකරනු ඇතැයි අපේක්ෂාකළ හැකි ය. එහෙත් උතුරු හා නැගෙනහිර පළාත් එකට එක්කළ ක්‍රමයක් බොහෝ දෙමළ පක්ෂවලට අවශ්‍ය වෙයි. ඒ පළාත් එක්කිරීමක් තබා ජනවර්ග මත පදනම්ව බලය බෙදීමක් නොකළ යුතුවන්නේ ඒ සඳහා කිසිම පදනමක් නැති බැවින් ය.

අද සාකච්ඡාවන බලය බෙදීමේ ජනවාර්ගික පදනමට මහජන එක්සත් පෙරමුණ විරුද්ධවන බව ප්‍රසිද්ධියේ කියා ඇත. ඒ පක්ෂය පසුගිය දා ඉදිරිපත්කෙරුණු තිස්ස විතාරණ යෝජනා මුළුමනින් ම ප්‍රතික්ෂෙප කළ අතර, බලය බෙදිය යුත්තේ ඒකීය ලංකාවක සංවර්ධනය හා පරිපාලනය පදනම්කරගෙන යැයි කියා සිටියි. මෙහි දී වඩා වැදගත්වනුයේ එක්සත් ජාතික පක්ෂයෙන් ඇමතිකම් ලැබූවන් ක්‍රියාකරන ආකාරය ය. ආණ්ඩුවේ එ ජා ප මන්ත්‍රීවරුන් අතර ෆෙඩරල්වාදීහු ද වෙති. ශ්‍රි ල නි පක්ෂයේ ද ෆෙඩරල්වාදීන් සිටින බව අමතක නොකළ යුතු ය. සුදු නෙළුම් ගෙන

© Prof. Nalin De Silva

තවලම් ගිය අය තම අදහස් වෙනස්කරගෙන ඇතැයි සිතිය නො හැකි ය. අද ආණ්ඩුවේ බල තුලනය ෆෙඩරල්වාදීන්ට වාසිවන අයුරින් වෙනස් වී ඇති බව පැහැදිලි ය. ඒ තත්වය පරාජයකිරීමට, ආණ්ඩුවේ ඒකීයවාදීන්ට හැකි වේ ද?

මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපති පදවියට පත්වූ විගස මෙවැනි ප්‍රශ්නයක් ඇසීමේ අවශ්‍යතාවක් නො වී ය. ආණ්ඩුවෙහි ඒකීයවාදීහු ඉතා ප්‍රබලවූහ. ආණ්ඩුවේ ඇමතිධුර භාර නොගත්ත ද, ජ වි පෙ හා ජාතික හෙළ උරුමය ආණ්ඩුවට බලපෑම්කිරීමෙහි ලා ශක්තිමත් තැනක සිටියේ ය. ඒ තත්වය වර්ධනය කරගනිමින් ආණ්ඩුවට එකතුවනු වෙනුවට ජ වි පෙ තම මාක්ස්වාදී මතිමතාන්තරවල එල්බගනිමින් සංධානයෙන් පවා ක්‍රමයෙන් ඉවත්වන තැනකට තල්ලු විය. ජ වි පෙරමුණට තම මාක්ස්වාදී හැව හැර ජාතිකත්වයේ පක්ෂයක් බවට පත්වීමට නොහැකිවීම මෙරට නූතන දේශපාලනයේ ඛේදවාචකය වෙයි. ජාතික මතයක් ඉදිරියට ගෙනයෑමට ඒ පක්ෂය මහඟු කාර්යයක් කර ඇති නමුත් ජාතිකත්වයේ පක්ෂයක් නොවී ඉදිරිගමනක් නොමැති බව තේරුම්ගැනීමට පක්ෂයේ දේශපාලනය මෙහෙයවන මාක්ස්වාදීන්ට නොහැකි වෙයි. පක්ෂයේ ප්‍රචාරක ලේකම්වරයා දේශපාලන තීන්දුගැනීමේ දී එතරම් වගකීමක් නොදරන බව ඇතැම් ජාතිකවාදී ප්‍රධානීන්ට ද තේරුම්ගැනීමට නොහැකිවීම දේශපාලන අපරිණතබවේ ලක්ෂණයක් වෙයි.

කෙසේ වෙතත් 2000 මැතිවරණයෙහි දී ශ්‍රී ල නි පක්ෂය කීතුකරන ආකාරයේ විවේචන කළ ජාතික හෙළ උරුම ඇතැම් නායකයන් (එකල පැවතියේ සිහළ උරුමය ය) ප්‍රකාශිතව ම ආණ්ඩුවේ කොටස්කරුවන් වීමට තීරණයකිරීම වැදගත් වෙයි. මා මේ කරුණු මතක්කරන්නේ අද ලංකාව අතීතයක් හා අනාගතයක් නැති වර්තමානයක් පමණක් ඇති රටක් ලෙස කටයුතුකරන බැවිනි. අද විශේෂයෙන් ම සිංහලයන් කතාකරන්නේ වර්තමානය ගැන පමණකි. වර්තමානය කීව ද ඔවුන්ට වැදගත් පසුගිය අවුරුද්ද නැත්නම් දෙක පමණකි. මෙරට දේශපාලනඥයන්ට රෙදි ඇඳගෙන ම පිල් හා ප්‍රතිපත්ති වෙනස්කිරීමට හැකි වීමට ප්‍රධාන කරුණ ද  අප වර්තමානයෙහි පමණක් ජීවත්වීම ය. ඊනියා ජනවාර්ගික ප්‍රශ්නයේ ආරම්භය 1948න් ඈතට ගෙනයෑමට සිංහලයෝ ද දෙමළ හා මුස්ලිම් ජනයා ද අකමැති වෙති. දෙමළ හා මුස්ලිම් ජනයා එයට අකමැතිවීමට හේතුවක් වෙයි. එමගින් ඊනියා නිදහසින් පසුව දෙමළ ජනයාට (මුස්ලිම් නායකයන් කරන්නේ කළ දුටු කල වල ඉහගැනීමකි) අසාධාරණයක් ඇති වී යැයි කීමට දෙමළ නායකයෝ ඉදිරිපත් වෙති. මේ අසාධාරණය යනු ව්‍යාජයක් බව ප්‍රශ්නය දහනවවැනි සියවසට නොව විසිවැනි සියවසේ මුලට ගෙනගිය ද අවබෝධවෙයි. එහෙත් වර්තමානයේ ජීවත්වන සිංහලයන්ට ඒ අවශ්‍ය නො වෙයි. ලෝකයේ වෙනත් ජාතියක් හෝ ජනවර්ගයක් හෝ නොකළ ආකාරයකට ඉතිහාස හැඟීමක් ඇතිව වංශකතා ලියූ ජාතියකට ඉතිහාසය එපා කෙළේ ඉතිහාසය පාසල් විෂය මාලාවෙන් ඉවත්කිරීම මගින් නො වේ. බ්‍රිතානියෝ පාසල්වල ඉතිහාසය ඔවුන්ට අවශ්‍ය ආකාරයෙන් ඉගැන්වීමෙන් ම ඒ කාර්යය ඉටුකළහ. ඒ බව ද සිංහලයන්ට අමතකවීම පුදුමයක් නො වේ.

අද ආණ්ඩුවේ ෆෙඩරල්විරෝධීන්ට තම සම්පූර්ණ ශක්තිය යොදා එහි ෆෙඩරල්වාදීන් මෙන් ම වදේශිය විජාතික බලවේග ද පරාජයකිරීමට සිදුවනු ඇත. එක්සත් ජාතික පක්ෂයේ ඇමතිවරුන් අතර මහජන පක්ෂයෙහි පැරණි සාමාජිකයෝ ද වෙති. ඔවුන් පක්ෂ මාරුකළ ද තම ලා රෝසපාට මාක්ස්වාදය අමතක කර නැත. ඔවුහු ජාතිකත්වයට එරෙහි වෙති. අලි මදිවාට හරක් කිවාක් මෙන් ලිබරල්වාදීහු ද ආණ්ඩුවේ ඇමතිවරු වෙති. ඔවුන් දන්නා මෙරට ඉතිහාසයක් නොව වර්තමානයක් ද නැත. ඔවුන් දන්නේ බටහිර වර්තමානයත් ඔක්ස්ෆඩ් විශ්වවිද්‍යාලය පිහිටුවීමෙන් පසුව බටහිර ඉතිහාසයත් ය. ඔක්ස්ෆඩ් විශ්වවිද්‍යාලය පිහිටුවීමට පෙර ලෝකයට ඉතිහාසයක් තිබී නැති ආකාරයට ඔවුහු හැසිරෙති. ෆෙඩරල්වාදීන් සමගකිරීමට ඇති සටනෙහි බරපතල බව ෆෙඩරල්විරෝධීන් ඉක්මනින් ම තේරුම්ගන්නා තරමට ජාතිකත්වය ජයග්‍රහණය කරනු ඇත. ආණ්ඩුවෙහි ෆෙඩරල් විරෝධීන්ගේ සංධානයක් ඇතිවිය යුතු අතර මහින්ද චින්තනවල සඳහන් ඒකීයත්වය (ඉන්දියාවට අවශ්‍ය ව්‍යාජ ෆෙඩරල් ක්‍රමය නොව) ආරක්ෂාකිරීම සඳහා මහජනයා සම්බන්ධකරගත් ව්‍යාපාර බිහිකළ යුතුවෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva